මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700 | ෆැක්ස් / பெக்ஸ் / Fax (94)-11-2449823 | වෙබ් අඩවිය / வெப் சைட் / Website www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No. SA/MA/AA/Circular 2015 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2015.06. 24

**රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක :- 243/2015**

සියලු අමාත්‍යාංශ ලේකම්වරු සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

<u>පාර්ලිමේන්තුව සතු රාජ්‍ය මූල්‍ය පාලනය බලගැන්වීම</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන අතර ඒ අනුව රාජ්‍ය ආදායම් එකතුකිරීම සහ වියදම් දැරීම පාර්ලිමේන්තු අනුමැතිය ඇතිව සිදුකළ යුතු ය.

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) වගන්තිය ප්‍රකාරව නියමිත කාර්යය සඳහා නීතියෙන් වෙන් කරනු නොලබන සියලුම ලැබීම් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර ඒකාබද්ධ අරමුදලින් වියදම් දැරීමේදී එකී ව්‍යවස්ථාවේ 149(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව මගින් සම්මත කරනු ලබන විසර්ජන පනත හෝ වෙනයම් පනතක් මගින් අනුමත කර ඇති වියදම් පමණක් දැරිය යුතුවේ.

3. එසේ වුවද, ඇතැම් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල අනුමත ලැබීම් ඇස්තමේන්තුවලින් පරිබාහිර විවිධ ආකාරයේ ආදායම් රැස්කරන අතර ඒවා මු.රෙ. 569 යටතේ වූ III වැනි පන්තියේ විවිධ තැන්පතු ගිණුමේ රඳවාගෙන වාර්ෂික විසර්ජන පනතින් අනුමත වූ වියදම්වලට පරිබාහිර වියදම් දැරීම සඳහා යොදාගන්නා බව නිරීක්ෂණය වී ඇත.

4. එසේ, තැන්පතු ගිණුම් යටතේ එකතු කරනු ලබන ලැබීම් හා එම ගිණුම යටතේ සිදුකරනු ලබන ගෙවීම් ජනරජ ගිණුමේ ආදායම් හා වියදම් ලෙස සටහන් නොවන බැවින් ජනරජ ගිණුමෙන් රජයේ සත්‍ය ආදායම හා වියදම නිරූපණය නොවේ.

5. එබැවින්, තැන්පතු ගිණුම් අංක 6000 යටතේ වන අංක 15 කාණ්ඩයේ තැන්පතු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා වූ 6003 තැන්පතු ගිණුම සම්බන්ධයෙන් මින් ඉදිරියට පහත සඳහන් ක්‍රියාපටිපාටියට අනුව කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.

5.1. 6000(15) කාණ්ඩය හා 6003 යටතේ වන විවිධ තැන්පතු සම්බන්ධයෙන් වන සියලුම ලැබීම් සඳහා පහත සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු ය.

(අ) නිශ්චිත ආදායම් සංකේතාංක යටතේ හඳුනාගත හැකි සියලුම ලැබීම් අදාළ ආදායම් සංකේතාංකයට බැර කළ යුතු ය.

(ආ) අඛණ්ඩව රැස්කරනු ලබන එහෙත් නිශ්චිත ආදායම් සංකේතාංක හඳුන්වාදී නැති ලැබීම සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව දැනුවත්කොට නව ආදායම් සංකේතාංක ලබාගත යුතු ය.

(ඇ) තැන්පතු ගිණුම් අංක 6000(15) කාණ්ඩය හා 6003 යටතේ වන විවිධ තැන්පතුවල ඇතුළත් වන එහෙත් ඉහත (අ) සහ (ආ) යටතට නොගැනෙන අනෙකුත් සියලුම ලැබීම්, විවිධ ආදායම් සංකේත අංක 2003.02.99 ට බැර කළ යුතු ය.

5.2. ඉහත 5.1 යටතේ හඳුනාගනු ලබන ලැබීම තැන්පතු ගිණුමේ ලැබීම ලෙස කිසි විටෙකත් රඳවා නොගත යුතු අතර රැස්කරනු ලබන ආදායමෙන් යම්කිසි මුදලක් වියදම ලෙස දැරිය යුතු වේ නම් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අයවැය ඇස්තමේන්තු තුළින් සපයාගත යුතු ය.

5.3. ඒ අනුව, 2015 ජූලි මස 31 දිනට විවිධ තැන්පතු ගිණුමේ රඳවාගෙන ඇති ශේෂයෙන් 2015 වර්ෂයේ ඉදිරි මාස 05 ඇතුළත ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂා කරන මුදල හැර ඉතිරිය ආදායම් සංකේතාංක 2003.02.99 ට බැර කළ යුතු අතර 2015 අගෝස්තු මස සිට ඉහත 5.1 යටතේ දක්වා ඇති ලැබීම් තැන්පතු ගිණුමට බැර නොකළ යුතු ය. එමෙන්ම එම ආදායම් එකතුකිරීම සම්බන්ධයෙන් යම් වියදම් දැරීමක් අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන 2016 වර්ෂයේ සිට වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසාගත යුතු ය.

5.4. ඉහත 5.1 යටතේ ලැබෙන ලැබීම්වලින් යම්කිසි මුදලක් ආදායම් ලෙස රජයේ ඒකාබද්ධ අරමුදලට බැර නොකර තවදුරටත් රඳවාගැනීම අවශ්‍ය වන්නේ නම් හා එම ලැබීම් ඇමුණුම 01 හි දක්වා ඇති තැන්පතු කාණ්ඩයකට අදාළ කරගත හැකි නම් ඒ සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් එකී තැන්පතු කාණ්ඩය යටතේ වෙනම තැන්පතු ගිණුමක් විවෘත කර ගැනීමට කටයුතු කළ යුතු ය. එමෙන්ම ඉහතින් සඳහන් කළ යම්කිසි ලැබීමක් ඇමුණුම 01 හි සඳහන් තැන්පතු කාණ්ඩයකට අදාළ කරගත නොහැකි විටෙක හා එම ලැබීම් අඛණ්ඩව රැස්කරනු ලබන්නේ නම් ඒ සඳහා ප්‍රමාණවත් විස්තර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් ඒ සඳහා නව තැන්පතු කාණ්ඩයක් හා අංකයක් ලබාගත හැක. /

6. මෙම චක්‍රලේඛයේ විධිවිධාන තරයේ අනුගමනය කළ යුතු බව අවධාරණය කරන අතර චක්‍රලේඛයේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වේ නම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ දුරකථන අංක 0112-484753 මගින් අධ්‍යක්ෂ ඒ.පී. කුරුම්බලපිටිය මහතා විමසීමෙන් ලබා ගත හැක.

ආර්.එච්.එස්. සමරතුංග
භාණ්ඩාගාර ලේකම්

පිටපත:

විගණකාධිපති

## පොදු තැන්පතු කාණ්ඩ-6000

| වර්ගය | ගිණුමේ නම |
|---|---|
| 01 | ඇප තැන්පත් - Security Deposits |
| 02 | ටෙන්ඩර් තැන්පත් - Tender Deposits |
| 04 | සංස්ථා හා අරමුදල් - Corporation & Funds |
| 05 | රජයට පවරා ගන්නා ලද ආයතන - Institutions taken over by Government |
| 06 | අරමුදල් (මණ්ඩල) - Funds |
| 07 | අතිරික්ත මුදල් - Surplus Funds |
| 08 | ක්ෂය සංචිත අරමුදල් - Depreciation Reserves |
| 09 | තාවකාලික ණයට ගැනීම් - Temporary Borrowings |
| 10 | ප්‍රදාන (විදේශීය) - Grant ( Foreign) |
| 11 | ප්‍රතිපාදන තැන්පත් Allocation Deposits |
| 12 | හදිසි අවස්ථා අරමුදල් - Contingency Funds |
| 13 | තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු (අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල වෙත ප්‍රතිලාභ ගෙවීම් සඳහා වන කිසිදු ලැබීමක් මෙම ගිණුමෙහි තැන්පතු ලෙස ඇතුළත් නොකළ යුතු ය) - Temporary Retained Deposits Payble to Third Parties (Any Reciept to be Incurred for Incentive Payments to Staff of the Ministry/ Department should not be Deposited in this Account) |
| 14 | පළාත් සභා වෙත ආදායම් ප්‍රේෂණය කිරීම -Revenue Transfer to Provincial Councils |
| 16 | කොන්ත්‍රාත් සඳහා වූ රඳවුම් මුදල් - Retention money for Construction |
| 17 | වන්දි ගෙවීම් - Compensation |
| 18 | ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවාගැනීම් - Temporary Retention for Statutory Payments |
| 19 | ප්‍රදාන(දේශීය) - ආයතනික සමාජ වගකීම Grant (Domestic)- Corporative Social Responsibility |
| 20 | වියදම් ප්‍රතිපූර්ණය සඳහා අරමුදල් ලැබීම්- Funds Received for Reimburesement of Expenditure |

මගේ අංකය

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
ගිණුම්සේවා ශාඛාව

<u>**ප්‍රධාන ලෙජරයේ / උප ලෙජරයේ අලුතින් ගිණුමක් ආරම්භ කිරීමේ ඉල්ලුම් පත්‍රය**</u>

1.1 ගිණුම් ආරම්භ කළ යුතු ලෙජරය: ප්‍රධාන ලෙජරය/ පොදු තැන්පත්/ අනුමත අක්මුදල්/අනුමත අත්තිකාරම්

1.2 ඉල්ලුම් කරන ගිණුම උප ගිණුමක් ලෙස ආරම්භ කළ නොහැකිද ?

2.1 ගිණුමේ නම: (සිංහලෙන්)

2.2 (ඉංග්‍රීසියෙන්)

3.1 ශාඛාව:

3.2 ගිණුම භාවිත කිරීමේ අරමුණු (කෙටියෙන් පැහැදිලි කරන්න)

3.3 ගිණුම පිළිබඳ වග කියන නිලධාරියාගේ තනතුර:

4.1 ගිණුම පාලනය කරන දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශයේ නම:

ශීර්ෂ අංකය: වර්ෂය: අක්මුදල් අංකය:

4.2 ගිණුම පාලනය කරනු ලබන්නේ අමාත්‍යාංශයකට අයත් දෙපාර්තමේන්තුවක් නම් අදාළ අමාත්‍යාංශයේ නම:

ශීර්ෂ අංකය: වර්ෂය:

5. බැංකු ගිණුම් අංකය, බැංකුව හා ශාඛාව:

6. මෙයට පෙර ඉහත ඉල්ලුම් කරනු ලබන කාර්යය සඳහා ගිණුමක් විවෘත්ත කර තිබේද ? එසේ නම් එහි ගිණුම් අංකය:

7. මෙම ගිණුමට කරනු ලබන හර පිළිබඳ කෙටි විස්තරයක්

8. මෙම ගිණුමට කරනු ලබන බැර පිළිබඳ කෙටි විස්තරයක්

9. වසර අවසානයේ මෙම ගිණුම් ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කරන්නේද ?

10. වාර්ෂික ගිණුම්වල මෙහි ශේෂයන් පෙන්නුම් කළ යුතු ආකාරය පිළිබඳ විස්තර:

11. මේ සම්බන්ධ පාර්ලිමේන්තු පනතක් තිබේ නම් ඒ පිළිබඳ විස්තර:

ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන:
නිල මුද්‍රාව
දිනය

12. වෙන් කරන ලද ගිණුම් අංකය:

නිලධාරියාගේ නම, අත්සන හා දිනය:

13. පරිගණකයෙහි සටහන් කරන ලදී

අංශ ප්‍රධානියාගේ අත්සන
දිනය:

සටහන:

01. නොගැළපෙන වචන කපා හරින්න. ඉල්ලා ඇති සියලු ම විස්තර සපයන්න

02. මෙම ගිණුමට අදාළව මෙයට ප්‍රථමයෙන් ගිණුමක් විවෘත කර නොමැති බවට සෑහීමකට පත්විය යුතු ය.

03. ගිණුම වසා ගිණුම් කටයුතු අවසන් කරන තුරු මෙම ගිණුමට හර/ බැර කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන සෑම ලියවිල්ලක්ම මෙම සංකේත අංකය සටහන් කර එවිය යුතු ය .

04.ගිණුමේ අවශ්‍යතාවය අවසන් වූ ශේෂය නිරවුල් කර ලෙජරයෙන් ඉවත් කිරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතු ය.

05. සෑම මසකම භාණ්ඩාගාර පරිගණක සටහන් හා දෙපාර්තමේන්තු පොත් සසඳා නිවැරිදිතාවය තහවුරු කළ යුතු ය.

06. භාණ්ඩාගාරයේ ශාඛාවන් සඳහා ගිණුම විවෘත කරන්නේ නම් එම ශාඛාවේ අධ්‍යක්ෂ විසින් පෞද්ගලිකව මෙම ආකෘතිය අත්සන් කළ යුතු ය.